# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව

## 1994 අංක 3 දරණ දකුණු පළාත් සභාවේ මුදල් (සංශෝධිත) ප්‍රඥප්තිය.

දකුණු පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමතය
(සටහන් කළේ 1994 දෙසැම්බර් මස 02 දින)

දකුණු පළාතේ පළාත් සභාවේ නියමය පරිදි
මුද්‍රණය කරන ලදී.

---

දකුණු පළාතේ පළාත් ආදායම් කොමසාරිස් කාර්යාලයෙන්
මිළදී ගත හැක.

---

ගාල්ලේ ආචාර්යදශ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

මිළ: රු. 2/-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
දකුණු පළාතේ පළාත් සභාව

1994 අංක 3 දරණ දකුණු පළාත් සභාවේ
මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

මෙම ප්‍රඥප්තිය 1994 නොවැම්බර් මස 30 වෙනි දින පවත්වන ලද දකුණු පළාත් සභා රැස්වීමේදී සභා සම්මත වූ බව සහතික කරමි.

සභාපති
දකුණු පළාත් සභාව

# 1990 අංක: 07 දරණ දකුණු පළාතේ මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ සම්මත කරනු ලැබේ.

| | | |
|---|---|---|
| ලුහුඩු නාමය | 1 | මේ ප්‍රඥප්තිය 1994 අංක: 3 දරණ දකුණු පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය ලෙස හඳුන්වනු ලැබේ. |
| 1990 අංක: 07 දරණ දකුණු පළාතේ මුදල් ප්‍රඥප්තියේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම. | 2 | 1990 අංක: 07 දරණ දකුණු පළාතේ මුදල් ප්‍රඥප්තියේ දීර්ඝ නාමය එහි ''මුද්දර ගාස්තු පනතේ ඇතැම් විධි විධාන වලට අනුකූල වේ'' යන වචන ඉවත් කොට, ඒ වෙනුවට ''මුද්දර ගාස්තු පනතේ සහ සංශෝධිත පරිදි වූ මහ නගර සභා ආඥපනතේ සහ සංශෝධිත පරිදි වූ නගර සභා ආඥාපනතේ සහ 1987 අංක: 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ ඇතැම් විධි විධාන වලට අනුකූල වේ.'' යන වචන ආදේශ කිරීම මෙයින් සංශෝධනය කරනු ලැබේ. |
| අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල නාමය බලපැවැත්විය යුතු බව. | 3 | මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වූ විටෙක, සිංහල භාෂා පාඨය බලපවත්වන්නේය. |

දකුණු පළාත් සභාව මඟින් සම්මත කරන ලද මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 154 එච් වගන්තියප්‍රකාර දකුණු පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 1994. 12. 02 දින අනුමත කර ඇත.